**ජාතික ලොතරැයි මණ්ඩලය - 2023**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින්, සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සා ධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී .

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිත තාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සා ධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරි පත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද, පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව උපචිත පදනමට ගිණුම්ගත කරනු ලැබුවද, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් පවත්වනු ලැබූ විශේෂ දිනුම්වාර සහ විශේෂ ත්‍යාග ගිණුම්ගත කිරීමේදී මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | සාමාන්‍ය ත්‍යාග රටාවන්ට අමතරව ත්‍යාග සංචිත අරමුදල භාවිතාකර පාරිභෝගිකයින් ප්‍රවර්ධනය (Customer Promotion) කිරීම උදෙසා ලබා දෙනු ලබන විශේෂ ත්‍යාග ගිණුම්ගත කිරීමේදී, ත්‍යාග සඳහා පමණක් ගිණුම්ගත කිරීම සිදු කරනු ලබයි. හිමිකම් නොපෑ වලංගු කාලය අවසන්වූ විශේෂ මුදල් හා භාණ්ඩ ත්‍යාග රාජ සන්තක කිරීමක් සිදු නොකරන අතර විශේෂ භාණ්ඩ ත්‍යාග ඉදිරි දිනුම් ඇදීම සඳහා භාවිතා කරනු ලබයි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුව මණ්ඩලයේ සාමාන්‍ය ත්‍යාග සහ විශේෂ ත්‍යාග උපචිත පදනමට ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 61 ජේදයට පටහැනිව වාසනා සම්පත ලොතරැයිය වෙනුවෙන් වෙන් කළ රු.99,904,204 ක් එම ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු ආදායමට ගැලපීමකින් තොරව මහජන සම්පත ලොතරැයි ත්‍යාග අරමුදලට ගැලපීම් කර තිබුණි. | වාසනා සම්පත ලොතරැයිපත ආරම්භ කිරීමේදී මණ්ඩලය සතුව පැවතියේ මහජන සම්පත ලොතරැයිය පමණක් වන අතර එහි ත්‍යාග සංචිත අරමුදල මඟින් වාසනා සම්පත සඳහා ත්‍යාග මුදල් ලබාදී ඇත. එම අරමුදල් භාවිතයෙන් ආරම්භ කරන ලද වාසනා සම්පත ලොතරැයිය | ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ට අනුව වාසනා සම්පත ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු එම අරමුදලේ ශේෂය ආදායමට ගැලපිය යුතුය. |

| | | |
|---|---|---|
| | අලෙවිය අලාභදායි ලෙස පහළ යෑම මත එම ලොතරැයිය අවසන් කිරීමේදී එහි ත්‍යාග සංචිත අරමුදලෙහි ඉතිරි ශේෂය වන රු.72,247,855 ක වටිනාකම හා එහි ත්‍යාග පාලන ගිණුමේ ඇති රු.27,656,429 ක ශේෂයෙහි එකතුව වන රු.99,904,204 ක මුදල මහජන සම්පත ත්‍යාග සංචිත අරමුදලට හා ත්‍යාග පාලන ගිණුමට ගැලපීම් කර ඇත. | |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ පවත්වනු ලැබූ ලොතරැයි වර්ග 07 ක විශේෂ මුදල් ත්‍යාග සහ භාණ්ඩ ත්‍යාග වෙනුවෙන් ගෙවිය යුතු රු.105,154,933 ක් මණ්ඩලයේ ගිණුම්වල වියදම් සහ වගකීම් ලෙස ගැලපීම් කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ත්‍යාග වියදම සහ ගෙවිය යුතු ත්‍යාග වටිනාකම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ඉහත ත්‍යාග වටිනාකමින් රු.21,671,746 ක් මාස 06 ඉක්ම වූ හිමිකම් නොපෑ විශේෂ ත්‍යාග වුවත් එම වටිනාකම ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ලොතරැයියක අලෙවිය ඉහළ නැංවීමේ, පාරිභෝගික ආකර්ෂණය උපාය මාර්ගයන් ලෙස විශේෂ ත්‍යාග ලෙස ඇතුළත් කර ඇති අතර විශේෂ ත්‍යාග වෙනුවෙන් වෙන් කර ඇති මුදල සඳහා ගැලපීම් කරනු ලබන්නේ එම ත්‍යාග සඳහා මාස 06ක් ඇතුළත ත්‍යාගලාභීන් හිමිකම් පෑමේදී පමණි. | මණ්ඩලය පවත්වන සෑම ලොතරැයි දිනුම් ඇදීමක් වෙනුවෙන් ගෙවිය යුතු මුළු ත්‍යාග වියදම ගිණුම්ගත කළ යුතු අතර මාස 06 ක් ඉක්ම වූ හිමිකම් නොපෑ ත්‍යාග මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා වගකීමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ආ) | මහජන සම්පත විශේෂ දිනුම්වාරයේ රු.170,892,800 ක් වූ මුළු අලෙවි ආදායමෙන් රු.28,197,312 ක් ඒකාබද්ධ අරමුදලට ලබාදිය යුතු වුවත්, රු.11,108,032 ක් අඩුවෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. | ජයකිංග් විශේෂ දිනුම් වාරයේ එම දිනුම් වාරයට අදාළව නිසි පරිදි ගණනය කරන ලද ලොතරැයි අලෙවියෙන් සියයට 10 ක දායකත්ව ප්‍රතිශතය වන රු.17,089,280 ක සෘජු දායකත්වය ඒකාබද්ධ අරමුදල වෙත බැරකර ඇත. | මහජන ජයකිංග් විශේෂ ලොතරැයියේ අලෙවි ආදායමෙන් සියයට 16.5 ක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකළ යුතුය. |
| (ඇ) | 2022 පෙබරවාරි සිට 2023 දෙසැම්බර් දක්වා මණ්ඩලයේ බැංකු ගිණුමකට අලෙවි නියෝජිතයින් විසින් තැන්පත් කළ එකතුව රු.24,520,324 ක් අදාළ ගිණුම්වලට | මෙම මුදල් අලෙවි නියෝජිතයින් විසින් ණය පදනම මත ලබා ගත් ලොතරැයි සඳහා තැන්පත් කර ඇති මුදල් වන අතර එම මුදල් ප්‍රමාණයන් | අලෙවි නියෝජිතයින් විසින් මණ්ඩලයේ බැංකු ගිණුමට තැන්පත් කරන මුදල් කඩිනමින් අදාළ ගිණුම්වලට ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැලපුම් කිරීමකින් තොරව 2023 දෙසැම්බර් මාසයට ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2024 මුල් කාර්තුව තුළදී අදාල ගිණුම් වලට ගැලපුම් නොවී ඉතිරිව ඇත්තේ රු.2,193,805 ක් වන අතර එම මුදල් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මහජන සම්පත ජයකිංග් ලොතරැයියට අදාළව ත්‍යාග ගෙවීම් රු.831,096 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | මහජන සම්පත ත්‍යාග අරමුදලට මාරු කරන ලද රු.831,096 ක මුදල 2024 ජනවාරි මාසික ගිණුම් සැකසීමේදී සමුච්චිත ලාභ ගිණුමට ගැලපීම් කිරීමට කටයුතු කර ඇත. | වර්ෂයේ ත්‍යාග ගෙවීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ශේෂය | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| විගණනය විසින් 2023 අගෝස්තු 15 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා ලද තොරතුරු අනුව, එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ පහත සඳහන් වත්කම් ජාතික ලොතරැයි මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛණයේ හෝ වෙනත් වාර්තාවල ඇතුළත්වී නොතිබුණි. | | | | මෙහි සඳහන් වාහන ජාතික ලොතරැයි මණ්ඩලයට හිමිකාරත්වය දරන බවට ලේඛන සොයාගත නොහැකිවූ බැවින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් වාර්තාවක් ලබා දෙන ලෙස 2024 මාර්තු 07 දින ඉල්ලීමක් කර ඇත. | මෙම රථවාහන මණ්ඩලය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සිදුවී ඇති බැවින් මේ සම්බන්ධයෙන් වැඩි අවධානයකින් සොයා බැලිය යුතුය. |
| මෝටර් කාර් රථ | - | 05 | 05 | | |
| මෝටර් ලොරි රථ | - | 01 | 01 | | |
| සිංගල් කැබ් රථ | - | 01 | 01 | | |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් 04 ක් හැර අනෙකුත් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 91 ක් හා SMS | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තරඟකාරී වෙළඳපොල තුළ අලෙවිය ප්‍රර්ධනය කිරීමේ අරමුණින් දිනුම් අදින ලොතරැයිපත් සඳහා විශේෂ | මණ්ඩලය ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත් අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගත යුතු |

| | | | |
|---|---|---|---|
| | මඟින් ලොතරැයිපත් අලෙවි කරන අලෙවි නියෝජිතයින් 03 ක් වෙත රු.166,615,583 ක පැසිවි ලොතරැයිපත් ණයට අලෙවිකර තිබුණද, ඉන් ණයගැතියන් 48 ක් වෙතින් පමණක් රු.59,525,000 ක බැංකු ඇපකර ලබාගෙන තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් හැර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 46 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරක්ෂිතයක් ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අලෙවි නියෝජිතයින් වෙතින් රු.85,406,299 ක් අයවීමට තිබූ අතර ඉන් අලෙවි නියෝජිතයින් 05 ක් වෙතින් වසරක් ඉක්ම වූ ශේෂය රු.7,341,195 ක්ද, වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.1,446,198 ක්ද වී තිබුණි. | දිනුම් වාර ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී බැංකු ඇපකරයට අමතරව දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත ණය පදනම මත ලොතරැයිපත් නිකුත් කරනු ලැබේ. බැංකු ඇපකරවලට ලබා දිය හැක්කේ එදිනෙදා දිනුම් වාර වලට පමණක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විශේෂ දිනුම් වාර ක්‍රියාත්මක කිරීමේදී බැංකු ඇපකරවලට අමතරව දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත ණය පදනම මත ලොතරැයිපත් නිකුත් කරනු ලැබේ. | අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් 04 ක් හැර අනෙකුත් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 75 ක් වෙත රු.59,043,386 ක ක්ෂණික ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර ඉන් ණයගැතියන් 05 ක් වෙතින් පමණක් රු.4,300,000 ක බැංකු ඇපකර ලබාගෙන තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් හැර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 70 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරක්ෂිතයක් ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අලෙවි නියෝජිතයින් වෙතින් රු.54,875,636 ක් අය වීමට තිබූ අතර අලෙවි නියෝජිතයින් 17 ක් වෙතින් වසරකට වැඩි කාලයක් ඉක්මවූ අයවිය යුතු ශේෂය රු.7,917,747 ක් වී තිබුණි. | 2023 දෙසැම්බර් 31 ට අයවීමට තිබූ ණය මුදලින් මේ වනවිට රු.39,180,912 මුදලක් ගෙවා අවසන්කර ඇත. | මණ්ඩලය ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත් අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගත යුතු අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | පැසිවි සහ ක්ෂණික ලොතරැයි සඳහා බැංකු ඇපකර ලබා දී තිබූ | 2024 මාර්තු 31 දින වන විට තව දුරටත් පියවීමට පවතින වටිනාකම | ණයට අලෙවිකරණ ලොතරැයිපත් වටිනාකම ආවරණය වන පරිදි |

| | | | |
|---|---|---|---|
| | අලෙවි නියෝජිතයින් 34 ක් වෙත එකී බැංකු ඇපකර වටිනාකම ඉක්මවා ණයට විකුණුම් සිදුකර තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම ලොතරැයි ණයගැතියන්ගෙන් අයකර ගත යුතු මුදල ඔවුන් විසින් ලබා දී තිබූ ඇපකර වටිනාකම ඉක්මවා රු.37,604,678 ක් දක්වා වැඩිවී තිබුණි. | රු.1,311,711 කි. එය 2023 වර්ෂයට අදාල විශේෂ දිනුම් වාර සඳහා නොමිලේ ලොතරැයිපත් ප්‍රවර්ධන වැඩසටහන් (Free Issue) හා පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන යටතේ පියවීමට පවතින වටිනාකම් වන අතර අදාළ පියවීම් කටයුතු සිදු වෙමින් පවතී. | ඇපකර ලබාගත යුතු අතර, මුදල් නොගෙවන ණයගැතියන් වෙතින් අයවිය යුතු මුදල්, බැංකු ඇපකර මඟින් ලබාගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලයේ සේවය කළ නිලධාරින් 5 ක් වෙත ලබාදී තිබූ ආපදා ණය මුදල්වලින් එකතුව රු.713,393 ක් වූ ණය ශේෂ 2012, 2017, 2018 සහ 2019 වර්ෂවල සිට ආපසු ගෙවීම අදාළ නිලධාරින් විසින් පැහැර හැර තිබුණද, එම අයවිය යුතු ණය ශේෂ 2023 දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | මණ්ඩලයේ සේවය කළ නිලධාරින් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ නිවාස ණය මුදල් වලින් එකතුව රු.1,519,920 ක්වූ ණය ශේෂ 2006 වර්ෂයේ සිට සහ 2016 වර්ෂයේ සිට ආපසු ගෙවීම අදාළ නිලධාරින් විසින් පැහැර හැර තිබුණද, 2023 දෙසැම්බර් 31 දක්වා එම අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වි තිබුණි. | නිලධාරීන් දෙදෙනා වෙත ලබා දී තිබූ නිවාස ණය මුදල් ගෙවීම ඔවුන් විසින් පැහැර හැරීමෙන් පසු මණ්ඩලය වෙත අය විය යුතුව පවතින ශේෂ අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීවයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු.3,603,093,604 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. | ඉහත සඳහන් නීති ප්‍රතිපාදන මඟින් ලොතරැයි අලෙවියෙන් ලැබෙන සම්පූර්ණ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ලබා දී ඇති ප්‍රතිපාදනයට අනුව යමින් මුදල් අමාත්‍යාංශය මඟින් මූලිකව නියෝග නිකුත් කර ඇත්තේ එවකට මහජන සම්පත හා වාසනා සම්පත ලොතරැයි ද්විත්වයක් පමණක් පැවතුණු බැවින්, එම ලොතරැයිපත් | අදාල පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අලෙවියෙන් ප්‍රතිශතාත්මකව මාසිකව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සිදු කිරීමටය. එවකට ලොතරැයි අලෙවියෙන් පසු ලාභය ශේෂ නොවූ බැවින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් සම්පාදනයට ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවා ඇති බැවින්ද භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නියෝග මත ඒ අනුව ලොතරැයි අලෙවියෙන් සෘජු දායකත්වයක් ඒකාබද්ධ අරමුදලට සිදු කරනු ලබන අතර 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ලොතරැයි අලෙවියෙන් සෘජු දායකත්වය ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබූ මුදල රු.3,841,947,982 කි. | |
| (ආ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය හා 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ ලොතරැයි 11 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, එනම් සියයට 10 ක වටිනාකමක් පමණක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වටිනාකම රු.506,725,125 ක් වී තිබුණි. | 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vol. II දරන ලිපිය ප්‍රකාරව එවකට පැවති මහජන සම්පත හා වාසනා සම්පත ලොතරැයි ආදායමින් සියයට 16.5 ක් වූ දායකත්ව ප්‍රතිශතය රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබූ අතර ඉක්බිතිව ආරම්භ කරනු ලැබූ අනෙකුත් සියලු ලොතරැයිපත් එම ලොතරැයිපත් අලෙවිය වෙළෙඳපොල තුළ ස්ථාවර වන තෙක් අලෙවි ආදායමින් 10% ක ප්‍රතිශතයක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත. එක් එක් ලොතරැයි වර්ගය අනුව ඒකාබද්ධ අරමුදලට සිදු කරන දායකත්වය පිළිබඳ ජාතික ලොතරැයි මණ්ඩලයේ රීතීන් තුළට ඇතුළත් කර ඇති අතර අනුමත රීතීන් ගැසට් පත්‍රයක් මගින් පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | අදාල පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |
| (ඇ) | 1963 අංක 11 දරන මුදල් පනතේ 14(3)(ඒ) වගන්තියේ (4) වන | මණ්ඩලය විසින් පවත්වන ලද සෑම ජාතික ලොතරැයි දිනුම් ඇදීමකින්ම එසේ දිනුම් අදිනු ලැබූ දින සිට | දිනුම් වාරයන්ට අදාළ හිමිකම් නොපෑ මාස 06 ඉක්මවූ මුදල් හා භාණ්ඩ ත්‍යාගවල වටිනාකම | පනතේ විධිවිධාන අනුගමනය |

| | | | | |
|---|---|---|---|---|
| | උපවගන්තිය | ගණන් බලනු ලබන මාස හයක කාලයක් ඉකුත්වීමෙන් පසුව ඒ ජාතික ලොතරැයියේ යම් ත්‍යාගයකට හිමිකම් ඇති තැනැත්තා සොයාගත නොහැකිවීම හේතු කොටගෙන ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රාජසන්තක කරනු ලැබිය යුතු අතර එම ත්‍යාග වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේවුවද, 2023 ජනවාරි 01 දින සිට ජුනි 30 දක්වා මාස 06 ඉක්මවූ හිමිකම් නොපෑ විශේෂ මුදල් ත්‍යාග සහ භාණ්ඩ ත්‍යාග එකතුව රු.21,671,746 ක් ඉහත පනතේ විධිවිධාන ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර නොකර මණ්ඩලයේ අරමුදල තුළ රඳවාගෙන තිබුණි. | වන රු.21,671,746 ක මුදල ප්‍රධාන ත්‍යාග රටාවෙන් පරිබාහිර විශේෂ ත්‍යාගයන් වේ. එම විශේෂ ත්‍යාග මුදල් රාජසන්තක නොකරන අතර එම ත්‍යාග සඳහා වෙන් කර මුදල් අදාළ ත්‍යාග සංචිත අරමුදලෙහිම තබා ගනු ලබන අතර ත්‍යාගලාභීන් ඉදිරිපත් නොවූ භාණ්ඩ ත්‍යාග නැවත ඉදිරි දිනුම් වාර වලදී විශේෂ ත්‍යාග ලෙස ලබා දීමට කටයුතු කරනු ලබයි. මෙම ත්‍යාගයන් සම්බන්ධව කටයුතු කරනු ලබන ආකාරය මණ්ඩලයේ රීතින් තුළටද ඇතුළත් කර ඇත. | කළයුතුය |
| (ඈ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ 1963 අංක 11 දරන මුදල් පනතේ 20(3) උප වගන්තිය | පනතේ විධිවිධාන අනුව මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් අනුමත කළ රීති ගැසට් පත්‍රයක පලකළ යුතු වුවත්, මණ්ඩලය විසින් 2016 මැයි 21 දින, 2018 මැයි 25 දින, 2022 ජනවාරි 27 දින සහ 2023 ජුලි 14 දින ආරම්භ කරන ලද මෙගා පවර්, ධන නිධානය, හඳහන සහ ලකී සෙවන් යන ලොතරැයිපත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද රීති පනතෙහි විධිවිධාන ප්‍රකාරව ගැසට් පත්‍රයක පල කර නොතිබුණි. එසේම, මණ්ඩලය විසින් 2010 පෙබරවාරි 28 සිට 2023 ජුලි 06 දක්වා කාලය තුළ විවිධ අරමුණු සඳහා ආරම්භ කරන ලද ලොතරැයි වර්ග 06 ක දිනුම් ඇදීමේ කටයුතු අත්හිටුවා තිබුණද, ඒ පිළිබඳව ගැසට් පත්‍රයක පලකර මහජනයා දැනුවත් කර නොතිබුණි. | මේ වන විට ගැසට් පත්‍රයේ පළ කර තිබූ රීති සම්පූර්ණයෙන් වෙනස් වීම මත ජාතික ලොතරැයි මණ්ඩලයේ රීති සංශෝධනය කර ඒ අනුව භාෂා ත්‍රිත්වයෙන් සංශෝධිත රීති ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය. | අදාල පනතේ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |
| (ඉ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රජයේ නීතිගත සංස්ථාවක කිසිම මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ආයෝජන කටයුතු සිදු කරන්නේ රාජ්‍ය සංස්ථා හා රජය සතු ආයතන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද | 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.6,121,604,396 ක් හා රු.2,055,129,520 ක් පිළිවෙලින් ස්ථාවර තැන්පතුවල හා කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2(v) ඡේදය ප්‍රකාරව හා PED 02/2018 චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රධාන බැංකු තුනෙහිය. මේ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීමට 2023.08.21 දාතමින් ලිපියක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමුකළද මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත. කෙසේ වෙතත් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා නැවත ලිපියක් මුදල් හා ආර්ථික ස්ථායිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 71 සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති මෙහෙයුම් අත් පොතෙහි (Operational Manual) 3.2 (i) විධිවිධාන | සංස්ථාපිත මණ්ඩල ඇතුළු රජය සතු ව්‍යවසායන් (SOE) විසින් සේවක තනතුරු ඇතුළු බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR), වැටුප් ව්‍යුහය සහ සේවක දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාල ඉල්ලීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ට සහ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, මෙම විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මත පමණක් මණ්ඩලයේ නිලධාරීන් වෙත පහත දැක්වෙන වැටුප් සහ දීමනා ගෙවා තිබුණි.<br><br>• මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් 341 ක් වෙත 2023 ඔක්තෝබර් මාසයේ සිට ඉදිරියට වැටුප් වර්ධක 06 බැගින් ලබා දී තිබුණු අතර, 2023 මූල්‍ය වර්ෂයට අදාළව පමණක් එම වියදම රු.3,107,820 ක් විය. | 2006 වසරේ දී නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සම්පූර්ණ රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනයේ දී ඉහළ කළමනාකාරිත්වයේ වැටුපට වඩා ඊට පහළ වැටුප් කාණ්ඩයන්ගේ (Management Assistant/ Primary Level) වැටුප් පරිමාණ අතර විශාල වෙනසක් පැවති බැවින් මෙම සේවකයින්ගෙන්ද ලැබෙන දායකත්වය පිළිබඳව යම් විශේෂත්වයක් සිදු කර පැවති ආර්ථිකයට සරිලන සේ ඉහළ වැටුපක් ලබා දීම සඳහා වැටුප් වර්ධක 05 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා දීමට අනුමැතිය ඉල්ලා 2008 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම වැටුප් සංශෝධනයේදී සිදුවී ඇති වැටුප් පරිමාණ අතර වෙනස නිරාකරණය කිරීම සඳහා පහළ වැටුප් කාණ්ඩයේ සේවකයින් හට වැටුප් වර්ධක 05 ක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කලයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | • මණ්ඩලයේ සේවයේ නියුතු සියළු නිලධාරීන් වෙත 2023 වර්ෂය තුළදී පමණක් රාජකාරී දීමනා, අවදානම් දීමනා, නිල ඇඳුම් දීමනා, නිෂ්පාදන දීමනා, සානුකම්පිත දීමනා, ඉලක්කගත සේවක අභිප්‍රේරණ ප්‍රතිලාභ, වෑන් රථවලින් විකුණුම් මත රාජකාරී දීමනා සහ සේවකයන්ට මූල්‍ය ත්‍යාග වශයෙන් එකතුව රු.205,608,174 ක දීමනා ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇත. | |
| (උ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | මණ්ඩලය විසින් 1998 වර්ෂයේදී අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර තිබුණි. එම අරමුදලට ලොතරැයි ත්‍යාග ලාභීන්ගේ පරිත්‍යාගවලින් හා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමාණයක ලැබීම් ලෙස බැර කර තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට එම අරමුදලේ ශේෂය රු.21,951,248 ක් වී තිබුණි. මෙලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මණ්ඩලය වෙත රඳවාගෙන තිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය වෙත මෙවන් අරමුදලක් පවත්වාගෙන යාමට නොහැකි බව දක්වමින් යොමු වූ විගණන විමසුම් සහ 2022 දෙසැම්බර් 13 වන දින මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේ පවත්වන ලද විගණන සහ කළමනාකරණ රැස්වීමේදී ද ලබා දෙන ලද මඟපෙන්වීම් පරිදි අදාළ අරමුදල උපයෝජනය කර අවසන් කිරීමට 2023 මැයි 08 දින පැවති 3854 අංක දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, අසරණ සරණ අරමුදල උපයෝජනය කිරීම සඳහා අරමුදලේ අරමුණු අනුව යමින් අසරණ පාර්ශවයන් වෙනුවෙන් සුභසාධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ අතර එම ක්‍රියාකාරකම්හි අවසන් ගෙවීම් මෙම වසරේ මැද භාගය වන විට අවසන් කර අරමුදල වසා දැමීමට නියමිතය. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |
| (ඌ) | 2015 මැයි 25 දිනැති අංක PED 2/2015 සහ 2022 ජනවාරි 18 දිනැති අංක PED 2/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 04 වන ඡේදය | ජංගම දුරකතන මිලදී ගැනීමේ වියදම් අදාළ නිලධාරියා පෞද්ගලිකව දැරිය යුතු වන අතර, ඒ සඳහා මණ්ඩලයෙන් වියදම් දැරීම නොකළ යුතුය. කෙසේවුවද, ඊට පටහැනිව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා නිලධාරීන් | ජාතික ලොතරැයි මණ්ඩලයේ පවතින රාජකාරී පරිසරය තුල ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාම සඳහා මාණ්ඩලික නිලධාරීන් වන සහකාර සාමාන්‍යාධිකාරී සහ ඉන් ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 22 ක් වෙත ජංගම දුරකතන 24 ක් ලබාදීම සඳහා රු.2,319,493 ක් වැය කර තිබුණි. තවද මහජන සම්පත 4633 දිනුම් වාරයේ අමතර ත්‍යාගයක් ලෙස ලබා දීමට තිබූ රු.510,000 ක ජංගම දුරකථනයක් දිනාගත් ත්‍යාගලාභියා ඉදිරිපත් නොවීම නිසා එම දුරකථනය ජාතික ලොතරැයි මණ්ඩලයේ නිලධාරියෙකු වෙත ලබාදී තිබුණි. | දායකත්වය සෑම මෙහොතකම අත්‍යාවශ්‍ය වේ. රාජකාරි දින වලදී මෙන්ම නිවාඩු දිනයන්හිදීද ජංගම දුරකථනය භාවිතය තුළින් රාජකාරි කටයුතු මෙහෙයවීමට සිදුව ඇත. ආයතනය වර්ෂයේ දින 360 කට ආසන්න දින ගණනක් අඛණ්ඩව විවෘතව පවතින බැවින් මෙම නිලධාරීන් නිරන්තරයෙන් රාජකාරි කටයුතුවල රැඳී සිටීමට සිදුව ඇත. එබැවින් එම නිලධාරීන් සඳහා දුරකථන පහසුකම් ලබා දීම ආයතනයේ වගකීමක් වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කොන්දේසිවලට යටත්ව ජංගම දුරකථන ලබා දීම සිදු කරනු ලැබේ. | |
| (එ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2019 වසරේ සිට රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ක්‍රමවේදය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදව (e -GP) යටතේ අංක P000381 ජාතික ලොතරැයි මණ්ඩලය ලියාපදිංචි වී ඇත. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e -GP) යටතේ ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් ලබා ගැනීමට කටයුතු සිදු කිරීමෙන් අනතුරුව එමඟින් සිදු කළ හැකි ඉදිරි ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (E -GP) අනුගමනය කරමින් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ඒ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදය | නිල වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ලබා දිය හැකි වන්නේ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් පමණි. 2023 අගෝස්තු 17 දින මණ්ඩලය වෙත එවා තිබුණු අංක PED/S/NLB/04/06(i) දරන රාජ්‍ය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 ට අනුව යමින් එම චක්‍රලේඛයේ පහළම නිලධාරි මට්ටම වන 2.3 කාණ්ඩයේ නිලධාරීන් යටතට මධ්‍යම කළමනාකරණ මට්ටමේ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |

ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින්ද සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීමේදී ඔවුන් අයත්වන මධ්‍යම කළමනාකරණ ගණයට අදාලව උක්ත චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව සිදු කළ යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව මණ්ඩලය විසින් පහත පරිදි ක්‍රියා කර තිබුණි.

- 2024 ජනවාරි සිට මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 දෙනෙකු HM 1-1 ගණයට අයත් සේ සලකා නිල වාහන හිමි නිලධාරීන්ට හිමි ඉන්ධන දීමනා සහ ප්‍රවාහන දීමනා ගෙවීමට 2023 දෙසැම්බර් 19 දිනැති අංක 3864-11 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව, 2024 ජනවාරි සිට මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 07 දෙනෙකු සඳහා මණ්ඩලයේ වාහනයක් සහ රියදුරෙකු බැගින් වෙන්කර දී මාසිකව ඉන්ධන ලීටර් 115 ක් බැගින් ඉන්ධන දීමනා ගෙවා තිබුණු අතර, තවත් නිලධාරීන් දෙදෙනෙක් සඳහා තම පෞද්ගලික වාහනය රාජකාරී කටයුතු සඳහා පරිහරණය කිරීමට ඉඩදී ඒ වෙනුවෙන් මාසිකව රු.50,000 ක ප්‍රවාහන දීමනාව සමග ඉන්ධන ලීටර් 115 බැගින් ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

ඇතුළත් කර එම චක්‍රලේඛ ප්‍රකාරව ඔවුන් වෙත ප්‍රතිපාදන 2024 ජනවාරි 01 දින සිට ලබා දීම සඳහා 2023 දෙසැම්බර් 19 දිනැති අංක 3864 -11 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇත. එමෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ගේ රාජකාරි කටයුතු සඳහා සංචිත වාහන භාවිතා කිරීමේ හැකියාව පවතී නම් එම වාහන භාවිතා කළ යුතු හැකි බවත්, රාජකාරි කටයුතු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය භාවිතා කිරීම ප්‍රායෝගික නොවන හා වියදම් අධික වන්නේ නම්, රාජකාරි ගමන් සඳහා වැය වන සත්‍ය ගමන් වියදම ප්‍රතිපූර්ණය කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විරුද්ධත්වයක් නොමැති බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 අප්‍රේල් 18 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

- ඉන්ධන දීමනා හිමිකම් නොමැති පහළ මට්ටමේ කළමනාකරුවන් (JM 1-1) 21 දෙනෙක් සඳහා 2023 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා ලීටර් 110 බැගින් මාසිකව ඉන්ධන දීමනා ප්‍රතිපූර්ණය කර තිබුණු අතර රු.35,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. එසේම කළමනාකරණ සහකාර (MA 1-2) නිලධාරීන් 15 දෙනෙකු සඳහා ලීටර් 25 බැගින් මාසිකව

2011 වසරේ සිට ක්ෂේත්‍ර නිලධාරි තනතුරු විධිමත් පරිදි ඇති කරන ලදී. එම තනතුරු මගින් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු ඉටු කිරීමට ඔවුන් වෙත එවකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වාහන හා ඉන්ධන යොදාගැනීමට අනුමැතිය ලබා දී රාජකාරි පැවරීම සිදු කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| | | ඉන්ධන දීමනා ප්‍රතිපූර්ණය කර තිබුණු අතර, රු.6,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. 2023 වර්ෂය තුළදී පමණක් මෙම නිලධාරින් වෙත රු.20,757,669 ක ඉන්ධන දීමනා සහ ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | | |
| (ඔ) | 2022 අගෝස්තු 08 දිනැති අංක PED 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 වන වගන්තිය | රාජ්‍ය ආයතනවල සංවත්සර ක්‍රියාකාරකම්වලට අදාළ සියලු වියදම් අත්හැරිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ 60 වන සංවත්සරය වෙනුවෙන් එකතුව රු.37,685,576 ක වියදම් දරා තිබුණි. | 2023 වසරේදී ජාතික ලොතරැයි මණ්ඩලයට වසර 60 ක් පිරීම නිමිති කොට ගෙන ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකත්වය ලබා දෙනු ලබන කාර්ය මණ්ඩලය දිරිගැන්වීම උදෙසා නිලධාරීන් සඳහා එක් අයෙකුට රු.60,000 බැගින් සුපිරි වෙළඳසලක වවුචර්පත් සහ මණ්ඩලයේ සේවයේ නියුතු සියළු නිලධාරීන් හට වැටුප් වර්ධක 06 ක් ලබා දෙන ලදී. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ඕ) | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.7 ඡේදය | සියළුම ආකාරයේ අනුග්‍රාහකත්ව, පරිත්‍යාග, ආයතනික සමාජ වගකීම් (CSR) වියදම් සහ ව්‍යාපාර නොවන ප්‍රවර්ධන වියදම් අත්හිටුවන ලෙසත්, ස්වභාවයෙන්ම වන එවැනි ඕනෑම වියදමක් අදාල අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මත පමණක් දැරිය යුතු බවත් දක්වා තිබුණද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ආයතනික සමාජ වගකීම් (CSR) වියදම් යටතේ රු.4,655,000 ක වියදමක් අදාල අනුමැතීන් නොමැතිව දරා තිබුණි. | 2023 වර්ෂයට අදාලව රු.4,655,000 ක වියදමක් සාමුහික සාමාජිය වගකීම් වැය ශීර්ෂය (CSR) යටතේ මණ්ඩලය විසින් දරා ඇති අතර එම වියදම සියලු අනුග්‍රාහක දායකත්වයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් සිදු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ක) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 - | | | |
| | (i) 4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය | ඊළඟ එළඹෙන වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දක්වමින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන | මෙතෙක් ප්‍රසම්පාදන සැලැස්ම වසර 03 ක් දක්වා සකස් කර නොමැති බැවින් ඉදිරියේදී සකස් කිරීමට සටහන් කර ගත්තෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සැලැස්මක් පිළියෙල කර අනුමත කරගත යුතු වුවත්, විගණනයට භාජනය කළ 2019 සිට 2023 දක්වා මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. | | |
| (ii) | 4.4 සහ ප්‍රසම්පාදන අත්පොතේ 4 වන පරිච්ඡේදය | සමාලෝචිත වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂා කර තිබූ රු.127,350,000 ක් වූ මෘදුකාංග මිලදී ගැනීමක් ප්‍රසම්පාදන අවස්ථා 09 ක් යටතේ ඛණ්ඩනය කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී බලය යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණි. | තොරතුරු තාක්ෂණ අංශය විසින් අදාල මෘදුකාංග මිලදී ගැනීම අයිතම වශයෙන් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලසුමට අනුව යමින් අදාල අයිතමයන් මිලදී ගැනීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී බලය යටතේ දක්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.32,014,201,280 ක්වූ අතර, පසුගිය වර්ෂයේ ආදායම රු.21,208,808,240 ක් විය. ඒ අනුව මණ්ඩලයේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.10,805,393,040 කින් හෙවත් සියයට 51 කින් වැඩිවී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය රු.650,877,152 ක් වූ අතර පෙර වර්ෂයේදී එම ලාභය රු.1,085,769,648 ක් වූයෙන් බදු පසු ලාභය රු.434,892,496 කින් හෙවත් සියයට 40 කින්ද අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ආදායම වැඩිවී තිබියදී ලාභය අඩුවීම සඳහා ප්‍රධාන වියදම් කාණ්ඩවන බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ මූල්‍ය හා අනෙකුත් වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මණ්ඩලයේ 2023 වර්ෂයේ සහ 2022 වර්ෂයේ විකුණුම්, අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ මූල්‍ය හා අනෙකුත් වියදම් කාණ්ඩයන්ට අදාළ වියදම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විස්තරය | වර්ෂය 2023 | 2022 | වෙනස | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියද | 1,408,116,521 | 920,609,013 | 487,507,508 | 53 |
| පරිපාලන වියදම් | 1,056,920,215 | 839,811,722 | 217,108,493 | 26 |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | 37,304,827 | 5,863,160 | 31,441,667 | 536 |

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම් සියයට 53 කින්ද, පරිපාලන වියදම් සියයට 26 කින්ද, මූල්‍ය සහ අනෙකුත් වියදම් සියයට 536 කින්ද වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව සහ කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | අනුපාතය | වර්ෂය | |
|---|---|---|---|
| | | **2023** | **2022** |
| (i) | දළ ලාභ අනුපාතය (සියයට) | 6.3 | 9 |
| (ii) | ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 2.03 | 5.12 |
| (iii) | ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 2.44:1 | 2.7:1 |
| (iv) | ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 2.42:1 | 2.7:1 |

මණ්ඩලයේ ප්‍රවර්තන වර්ෂයේ දළ ලාභ සහ ශුද්ධ ලාභ අනුපාතයන් පිළිවෙලින් සියයට 6.3 ක් සහ සියයට 2.03 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් සියයට 9 ක් සහ සියයට 5.12 ක් විය. ඒ අනුව, ප්‍රවර්තන වර්ෂයේදී දළ ලාභ සහ ශුද්ධ ලාභ අනුපාතයන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 2.7 කින් සහ සියයට 3.09 කින් අඩුවී තිබුණි. ඒ අනුව මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල කාර්යසාධනය අඩුවී ඇති බවට නිරීක්ෂණය වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය වෙත 2016/2017 සහ 2017/2018 තක්සේරු වර්ෂ වෙනුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් රු.1,450,773,080 ක සහ රු.1,232,783,401 ක දඩ මුදල් සහිතව ගෙවිය යුතු ආදායම් බද්දක් තක්සේරු කර තිබුණි. මණ්ඩලය ඒ වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ අභියාචනා සඳහා පිළිවෙලින් රු.335,994,244 ක සහ රු.308,195,850 ක බැංකු ඇපකර ලබාදීමට සිදුව තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට ඒ සඳහා පිළිවෙලින් බැංකු පොළී රු.12,326,250 ක් සහ රු.3,852,448 ක් වැය කර තිබුණි. කෙසේවුවද, අභියාචනා ඉදිරිපත් කර වසර 02 කට වැඩි කාලයක් ගතවී ඇතත් මණ්ඩලයට එරෙහිව ඉදිරිපත්වී ඇති එම ආදායම් බදු ගැටළුව මේ දක්වා විසඳී නැති අතර එම අභියාචනා සඳහා ලබාදී ඇති බැංකු ඇපකර වෙනුවෙන් තවදුරටත් අනවශ්‍ය ලෙස පොළී ගෙවීමට සිදුව තිබුණි. | ආදායම් බදු තක්සේරු සමග මණ්ඩලය එකඟ නොවූ බැවින්ද ආයතනය විසින් යොමු කරනු ලැබූ බදු අභියාචන දේශීය ආදායම් කොමසාරිස් මට්ටමින්ද විසඳුම් ලබා ගැනීමට නොහැකි වූ බැවින්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තීරණයට එරෙහිව කොමිෂන් සභාවට නියමිත පරිදි ඉදිරිපත් කරන ලදී. මෙම බදු අභියාචනා සිදුකිරීමේදී බැංකු ඇපකර ලබාදීම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා රාජ්‍ය බැංකුවලින් මිල කැඳවා ආයතනයට වාසිදායක වන අවම බැංකු ගාස්තු අයකළ බැංකු වෙතින් බැංකු ඇපකර ලබා දී ඇත. දැනට කොමිෂන් සභාව මඟින් අදාළ විමසීම් කටයුතු සිදු කරමින් පවතින අතර එහි තීන්දුව ලබාදීමට ගතවන කාලය පිළිබඳව අප හට මැදිහත්වීමත් සිදුකළ නොහැකි බව දන්වා සිටිමු. | ආදායම් බදු තක්සේරුවට බලපාන ලද කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතර එකඟතාවයක් කඩිනමින් ඇති කර ගත යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 28 දින දිනුම් අදින ලද එකක් රු.100 ක්වූ මෙගා 60 විශේෂ ලොතරැයි දිනුම් වාරයෙන් සහ 2023 දෙසැම්බර් 30 දින දිනුම් අදින ලද එකක් රු.1,000 ක්වූ මෙගා මිලියන් විශේෂ ලොතරැයි දිනුම් වාරයෙන් පිළිවෙලින් රු.143,253,000 ක සහ රු.143,193,000 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණද, එම ලොතරැයි දෙක සඳහා රජයේ දායකත්වය, නියෝජිත කොමිස්, ත්‍යාග පිරිවැය, මුද්‍රණ වියදම් සහ ප්‍රචාරණ වියදම් ඇතුළු ප්‍රවර්ධන වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු.201,225,240 ක් සහ රු.188,089,073 ක පිරිවැයක් දරා තිබුණි. කෙසේවුවද, මෙගා 60 විශේෂ ලොතරැයි දිනුම් වාරයේ අපේක්ෂිත අලෙවි ටිකට්පත් 2,422,371 ක ප්‍රමාණයෙන් ටිකට්පත් 1,432,530 ක් හෙවත් සියයට 59.14 ක් පමණක් අලෙවි කිරීමට හැකිවී තිබුණු අතර මෙගා මිලියන් විශේෂ ලොතරැයි දිනුම් වාරයෙන් අපේක්ෂිත අලෙවි ටිකට්පත් 300,000 න් ටිකට්පත් 143,193 ක් හෙවත් සියයට 47.73 ක් පමණක් අලෙවි කිරීමට හැකිවී තිබුණි. මේ අනුව මණ්ඩලයට මෙම ලොතරැයි දෙකේ අපේක්ෂිත අලෙවි ඉලක්ක ළඟාකරගත නොහැකිවීමෙන් පිළිවෙලින් රු.57,972,240 ක සහ රු.44,896,073 ක අලාභයක් ලබා තිබුණි. | නියමු ව්‍යාපෘති ලෙස මෙම විශේෂ ලොතරැයිපත් වෙළඳපොලට නිකුත් කර රජයට ආදායම් ඉහළ දැමීමටත් මේ වන විට ලොතරැයි මිලදී ගැනීමට පෙළඹවීමක් නොමැති ඉහළ ආදායම්ලාභී කණ්ඩායම් ඉහළ මිලක් සහිත ලොතරැයි මිලදී ගැනීම සඳහා පෙළඹවීම හා ඔවුන් අභිප්‍රේරණය සිදු කිරීමත් මෙමඟින් සිදු කරන ලදී. ඒ අනුව, එම අරමුණු ඉටු කර ගැනීම අපේක්ෂා කරන ප්‍රශස්ථ මට්ටමින් සිදු නොවූවද, මීළඟ දිනුම් වාරවලදී ඉහළ අලෙවියක් අත්කර ගැනීම සඳහා නූතන තාක්ෂණය සමඟ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයත් ඒ සඳහා පවතින ඉඩකඩත් එමඟින් ඉහළ අලෙවියක් ලබා ගැනීමේ හැකියාවත් හඳුනාගන්නා ලදී. | නිවැරදි මාර්ගෝපදේශ අනුව විශේෂ දිනුම් වාර පැවැත්වීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ නිලධාරියකු විසින් 2020 සැප්තැම්බර් 10 දින සිට 2020 දෙසැම්බර් 26 දින දක්වා අවස්ථා 23 දී ලොතරැයි අලෙවි ආදායම් ලෙස ලැබුණු එකතුව රු.4,736,005 ක් බැංකුගත කිරීමකින් තොරව මුදල් | මේ පිළිබඳව ආයතනික වශයෙන් මූලික විමර්ශනයක් සිදුකර ඇත. එමෙන්ම මේ සම්බන්ධයෙන් දැනගත් වහාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර අපරාධ පරීක්ෂණ | මණ්ඩලයේ අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කර මුදල් වංචා කිරීමට ඇති අවස්ථා වළක්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පොතේ ලැබීම් ලෙස ව්‍යාජ සටහන් යොදා එම මුදල් වංචාකර තිබුණි. කෙසේවුවද, එම වංචා කළ මුදල් මේ දක්වා මණ්ඩලයට අයකර ගැනීමට නොහැකිවී තිබෙන අතර එම මුදල් වංචා කළ නිලධාරියාට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම හැර වෙනත් ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් අධිකරණමය නියෝග ලබා ගෙන ජාත්‍යන්තර පොලිසියද දැනුවත් කර ඇත. | |
| (ඇ) | මණ්ඩලය විසින් දිනුම් ඇදීම සඳහා දෛනිකව මුද්‍රණය කරන ලොතරැයිපත්වලින් විශාල ප්‍රමාණයක් අලෙවි නොවී පවතින අතර, 2023 දෙසැම්බර් මාසයේ දී ටිකට්පත් 81,142,371 ක් මුද්‍රණය කර තිබූ අතර ඉන් ටිකට්පත් 1,664,296 ක් ගබඩාවේ ඉතිරි වී තිබූ අතර තවත් ටිකට්පත් 10,529,100 ක් අලෙවි කිරීමට නොහැකිව අලෙවි නියෝජිතයින් විසින් මණ්ඩලයට ආපසු එවා තිබුණි. ඒ අනුව දෙසැම්බර් මාසයේදී පමණක් මුද්‍රණය කළ ටිකට්පත් වලින් සියයට 15.03 ක ප්‍රමාණයක් එලෙස අලෙවි නොවී ඉතිරි වී තිබුණි. මේ අනුව 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පමණක් මුද්‍රණය කළ ටිකට්පත් 12,193,396 ක් අලෙවි කිරීමට නොහැකිව ඒ තුළින් ආසන්න වශයෙන් රු.මිලියන 697,661,020 ක් පමණ ආදායමක් අහිමි වී තිබුණි. එසේම මෙම අලෙවි නොවූ ටිකට්පත් මුද්‍රණය කිරීම සඳහා රු.14,066,175 ක් වැය වී ඇති අතර එම වියදම අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි. | දෙසැම්බර් මාසය තුළ දිවයින පුරාම දැඩි අයහපත් කාලගුණ තත්වයක් පැවති අතර විශේෂයෙන්ම දකුණු ප්‍රදේශයේ දැඩි අයහපත් නිරන්තර ගංවතුර තත්වයන් මත අලෙවිය සීඝ්‍ර ලෙස පහත වැටීමක් සිදු වූ අතර එවැනි පසුබිමක එක් දිනකින් කල් පිරෙන ලොතරැයිපතක ආපසු එවුම් පාලනය ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වේ. ඒ අනුව රජයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා අලෙවි ආදායම ඉහළ නැංවීම වෙනුවෙන් අලෙවියට ඇති අවශ්‍යතාවය මත ලොතරැයිපත් මුද්‍රණය අනර්ථකාරී වියදම් නොවන බව දන්වමි. | දෛනිකව අලෙවිවන ලොතරැයිපත් ප්‍රමාණය පිළිබඳ නිවැරදි ඇස්තමේන්තු සකස්කර ලොතරැයිපත් මුද්‍රණය කිරීම. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීවයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1963 අංක 11 දරන මුදල් පනත මගින් ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කර ඇති අතර ඉන් පසු එම පනතේ වගන්ති කීපයක් 1997 සහ 1998 වර්ෂවලදී සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, | පිළිතුරු ලබාදී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වර්තමානයේ මණ්ඩලයේ අරමුණුවලට ගැලපෙන නව පනත් කෙටුම්පතක් සකස් |

| | | |
|---|---|---|
| වර්තමානයේ මණ්ඩලයේ අරමුණුවලට ගැලපෙන පරිදි නව පනතක් කෙටුම්පත් කිරීමට 2017 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/0295/719/026 මගින් අනුමැතිය ලබාදී වසර 06 ක් ගත වී තිබුණද, නව පනතක් සකස් කිරීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | | කිරීම. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ දී මණ්ඩලය විසින් ජංගම දුරකතන හරහා කෙටි පණිවිඩ සේවාව මගින් ලොතරැයිපත් අලෙවි කිරීම ආරම්භ කර තිබුණි. මෙම සේවාව ආරම්භ කර මේ වන විට වසර 07 ක් ගතවී ඇතත් අලෙවි නියෝජිතයින් 03 ක් මගින් මුළු ලොතරැයිපත් අලෙවි ප්‍රමාණයෙන් සියයට 01 කට වඩා අඩු අගයක් අලෙවි කර තිබුණි. වර්තමානයේ කෙටි පණිවිඩ සේවාව හරහා ලොතරැයිපත් අලෙවිය වැඩි කර ගැනීමට වැඩි අවස්ථාව පැවතුණද, එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | නූතන තාක්ෂණ ප්‍රවණතා ඇති වීමත් සමඟ මණ්ඩලය විසින් SMS සේවාව පමණක් නොව Web අඩවිය, දුරකථනය, Web Optimize mobile app හරහා අලෙවිය සඳහා Digital අලෙවි නියෝජිතධූර ඇති කිරීමට විධිමත් සාකච්ඡා පවත්වා අලෙවි නියෝජිතධූර ඇති කිරීමට කටයුතු කරමින් පවතී. | නූතන තාක්ෂණ ක්‍රමවේද මගින් මණ්ඩලයේ ලොතරැයි අලෙවිය වැඩිකර ගැනීමට ක්‍රියා කළයුතු වීම. |
| (ආ) | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සමස්ථයක් ලෙස රු.650,877,152 ක බදු පසු ලාභයක් ලබා තිබුණද, විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් ගැලපීමට පෙර, ගොවිසෙත, ධන නිධානය, හඳහන, ලකී සෙවන්, මෙගා 60 සහ මෙගා මිලියන යන ලොතරැයිවලින් රු.699,603,774 ක අලාභයක් ලබා තිබුණි. මණ්ඩලය එක් එක් ලොතරැයිය වෙනුවෙන් වෙන වෙනම ලාභ/අලාභ ගණනය නොකිරීම නිසා පරිශීලකයින්ට එක් එක් ලොතරැයිවල ලාභ/අලාභ තත්ත්වය නිවැරදිව ඉදිරිපත් වී නොතිබුණි. | ඉදිරියේදී වර්ෂ අවසාන ගිණුම් තුළ එක් එක් ලොතරැයිපත වෙනුවෙන් වෙන වෙනම ලාභය ගණනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | එක් එක් ලොතරැයිවල ලාභ අලාභ වෙන වෙනම ගණනය කළ යුතු වීම. |
| (ඇ) | වර්ෂ 1963 දී ආරම්භ කරන ලද ජාතික ලොතරැයි මණ්ඩලය වර්ෂ 60 කට අධික කාලයක සිට කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල ව්‍යාපාර පරිශ්‍රය පවත්වා ගනිමින් සිටින අතර, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් ව්‍යාපාර පරිශ්‍රය පවත්වා ගැනීම වෙනුවෙන් රු.87,686,550 ක් ගොඩනැගිලි කුලී ලෙස ගෙවා තිබුණි. එසේම මණ්ඩලයේ ගබඩා පහසුකම් පිළිබඳ නිසි | ජාතික ලොතරැයි මණ්ඩලයට අයත් ඉඩමෙහි ඉදි කිරීමට යෝජිතව තිබු ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට උත්සාහ කළද නැවත දැනුම් දෙන තුරු රාජ්‍ය ආයතන වෙනුවෙන් ගොඩනැගිලි ඉදි කිරීම තාවකාලිකව නවතා දැමීමට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හමුවේ එම | ජාතික ලොතරැයි මණ්ඩලය සතු ඉඩම ඵලදායී කටයුතුවලට යෙදවීමට අවධානය යොමුකල යුතුය. |

| | | |
|---|---|---|
| ඇගයීමකින් තොරව පාරිභෝගික ප්‍රවර්ධන භාණ්ඩ මිලදී ගැනීම නිසා එම ප්‍රවර්ධන භාණ්ඩ ගබඩා කිරීම වෙනුවෙන් මාස 04 ක කාලසීමාවක් සඳහා තවත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීමටද සිදුව තිබුණි. කෙසේවුවද, මණ්ඩලය විසින් 2009 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. මිලියන 500 ක් වටිනා පර්චස් 112.05 ක ඉඩමක් කොළඹ වොක්ෂෝල් මාවතේ පවතින අතර, එහි ගබඩාවක්, රියදුරු නේවාසිකාගාරයක් සහ වාහන රථගාලක් පවත්වා ගනිමින් තිබුණි. | කටයුතු සාර්ථක නොවූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වර්තමානයේ ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වා ගෙන යන ගොඩනැගිල්ලේ බදු ගිවිසුම් කාල සීමාව දීර්ඝ කර ගන්නා ලදී. ජාතික ලොතරැයි මණ්ඩලයේ අලෙවි සහායකයින් සඳහා පාපැදි 500 ක් මිලදී ගත් අතර එම පාපැදි එළිමහනේ ගබඩා කළ නොහැකි බැවින්ද, එම පාපැදිවලට විකුණුම් පුවරු සවි කිරීමට ආවරණය වූ ඉඩකඩ අවශ්‍යවීම යන කරුණු මත වොක්ෂෝල් ගබඩාව තුළ ප්‍රමාණවත් නොවූ ඉඩකඩ එම ඉඩමට යාබදව පිහිටි රාජ්‍ය ආයතනයක් වන ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ගබඩාවක් මාසිකව රු.60,000 ක කුලී මුදලක් යටතේ ලබා ගන්නා ලදී. | |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දින දක්වා වසරක කාල සීමාවක් සඳහා ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 හි සඳහන් සති 38 ක කාල සීමා තුළ නිම කිරීමට නොහැකි වී තිබූ අතර 2021 ජුනි 25 දින ආරම්භ කර තිබූ එම ප්‍රසම්පාදන කටයුතු නිම කිරීම සඳහා 2023 මාර්තු අවසානය දක්වා වසර 01 යි මාස 09 ක් ගතකර තිබුණි. | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ කාලය තුළ කිහිපවරකදී රට තුළ අතිශයින් දරුණු කොවිඩ් - 19 වසංගත රෝගී තත්ත්වයක් පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස බාධාකාරී සිදුවීම් රැසකට මුහුණ දීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට සිදුව තිබිණි. අනතුරුව රට තුළ ඇති වු විදුලිබලය සහ ඉන්ධන ඇතුලු බලශක්ති අර්බුදය සහ අනෙකුත් සිදුවීම් නිසා රට තුළ පැවති අරගලකාරී වාතාවරණය නිසා ඇති වු ප්‍රවාහන දුෂ්කරතා, පූර්ණ සේවක මණ්ඩලයම සේවයට කැඳවීමේ අපහසුතා සහ ඇඳිරි නීති පැනවීම් මෙන්ම අමාත්‍ය මණ්ඩල ප්‍රම්පාදන කමිටු සාමාජිකයින් වරින්වර වෙනස් වීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට බාධා ඇති කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරමින් නියමිත කාලය තුළ ප්‍රසම්පාදන කාර්යයන් නිමකිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ කාර්ය සංග්‍රහයේ 4.2.2 සහ 4.2.3 හි උපදෙස් අනුව | ක්‍රියාත්මක කිරීමට නියමිත ඉදිරි ප්‍රසම්පාදනයන් සඳහා පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවන් ඇතුළත් කර | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මෙන්ම 2018 පෙබරවාරි 16 දිනැති අංක PMU 03 දරණ ප්‍රසම්පාදන අධීක්ෂණ චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති ආකෘතිය ප්‍රකාරව, මෙම ප්‍රසම්පාදනයේ කාල සටහන පිළියෙල කිරීමේදී, ලංසු ලේඛන පිළියෙල කිරීම දක්වා වූ පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවන් ඇතුළත් කර ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාල සටහන සකස් කිරිම සිදු කරනු ලබයි. | |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1 ඡේදය අනුව, තාක්ෂණික පිරිවිතර සැලසුම් කිරීම ආදිය ඇතුළු ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ආරම්භ කළ යුතු වුවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කළ පසුව එම ප්‍රසම්පාදනයට අදාල ලංසු ලේඛන පිළියෙල කිරීම ආරම්භ කර තිබුණි. මේ නිසා තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු ලේඛන පිළියෙල කිරීම සහ සංශෝධනය කිරීමට 2021 අගෝස්තු 04 දින සිට 2022 මාර්තු 08 දින දක්වා කමිටු රැස්වීම් 06 ක් මගින් මාස 07 කට වැඩි කාලයක් ගත කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීම ආරම්භ කිරීම සිදු කරන ලද අතර 2021.08.04 දින පළමු තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම පැවති අතර එදින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම කෙටුම්පත පරික්ෂා කිරීමෙන් අනතුරුව ඒ වන විට රට තුළ උද්ගතව තිබූ තත්ත්වයට කාලානුරූපී වන ලෙස ඇගයීම් නිර්ණායකයන්ගේ සහ තාක්ෂණික පිරිවිතරයන්ගේ සිදු කළ යුතු කාලෝචිත සංශෝධනයන් සිදු කිරීමට මාස 07 කට ආසන්න කාලයක් ගත කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ කාර්ය සංග්‍රහයේ අංක 7.4, 7.5 අනුව, ලංසුවල වලංගු කාලසීමාව තුළ කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට හැකිවනු පිණිස, එකහවූ ප්‍රසම්පාදන කාලසටහනෙහි සඳහන් කාල රාමු තුළ සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 5.3.10 අනුව, මෙම ප්‍රසම්පාදනයේ සාමාන්‍ය ලංසු වලංගුභාවය සඳහා උපරිම කාල පරිච්ඡේදයෙන් සියයට 50 ක කාලයක් ඇතුළත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම වාර්තාව සම්පූර්ණ කළ යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට ලංසු විවෘත කළ දින සිට දින 201 ක් ගත කර තිබුණි. එසේම | ආනයන සීමා කිරීම හේතුවෙන් ඇතිව තිබූ කඩදාසි සහ මුද්‍රණ තීන්ත ඇතුළු අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ගොවිසෙත සහ හඳහන ලොතරැයිපත් නැවත වෙළඳපොළට නිකුත් කිරීම සඳහා එම ලොතරැයිපත් මුද්‍රණය සඳහා කෙටි කාලීන ප්‍රසම්පාදනයක් ද ආරම්භ කර තිබූ අතර ඒ සඳහා කැඳවූ ලංසු ලේඛණ විවෘත කිරීමේ කටයුතුද සිදු කරන ලද්දේ 2022.04.22 වන දිනය. ඒ සඳහා පත්කරන ලද්දේද මෙම ප්‍රධාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවම වන අතර ගොවිසෙත සහ හඳහන ලොතරැයිපත් නැවත වෙළඳපොළට නිකුත් කිරීමට අදාල තාක්ෂණික | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයක කාලයක් සඳහා පමණක් ප්‍රදානය කර තිබූ මෙම ප්‍රසම්පාදනයේ ලංසු වලංගු කාලය, ලංසු කැඳවූ අවස්ථාවද ඇතුළත්ව අවස්ථා 04 කදී 2023 පෙබරවාරි 20 දින දක්වා දින 300 ක අසාමාන්‍ය කාලයක් දක්වා දීර්ඝ කර තිබුණි. එසේම ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 5.3.10 අනුව කටයුතු නොකිරීම නිසා අවම ලංසු මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයක් පසුව ලංසු මිල වැඩි කිරීම නිසා ඇගයීම්වලින් ඉවත් කර තිබුණි. | ඇගයීම් කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. පසුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසුකරුවන් සමඟ මිල සාකච්ඡාවක් (Price negotiation) සිදු කරන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලද අතර ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවසන් වාර්තාව 2022.11.22 දින ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. | |
| (ඉ) | ලොතරැයිපත් මුද්‍රණය සඳහා තිබිය යුතු “Fan Folding Mechanism” යන විශේෂාංගය නොතිබීම හේතුවෙන් ප්‍රධාන බැහැරවීම් වශයෙන් මූලික ලංසු ඇගයීමෙන් ඉවත් කර තිබුණු ආයතනයක් පසුව ඒ වෙනුවට වෙනත් තාක්ෂණයක් භාවිතා කරන බවට සඳහන් කරමින්, සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති සාර්ථක ලංසුකරුවකු වශයෙන් නැවත ඇගයීමට භාජනය කර ගොවිසෙත සහ හඳහන ලොතරැයිපත් වර්ග දෙක මුද්‍රණය කිරීම සඳහා ලංසු ප්‍රදානය කර තිබුණි. කෙසේවුවද, මණ්ඩලය විසින් අලෙවිය සඳහා ලොතරැයිපත් නිකුත් කිරීමේදී සහ ආපසු භාරගැනීමේදී, ලොතරැයිපත් අතරමැදින් අඩුවීමේ අවධානම ඉවත්වී නොතිබුණි. | ලොතරැයිපත් මුද්‍රණයේදී භාවිතා කරන “Fan folding mechanism” යන පිරිවිතරය නොතිබීම හේතුවෙන් ඉවත් කර ආයතනය පසුව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදු කරන ලද කර්මාන්තශාලා පරීක්ෂාවේදී මුද්‍රණය කරනු ලබන ලොතරැයිපත්හි තීරුකේත අංක නිවැරදි අනුපිළිවෙලින් මුද්‍රණයවේද යන්න සහතික කර ගැනීම සඳහා අදියර 06 කින් සමන්විත ක්‍රමවේදයක් භාවිතා කරන බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, එම සමාගම සාරානුකූල ප්‍රතිචාර දක්වන ලද සාර්ථක ලංසුකරුවෙකු ලෙස සලකා බැලුනු අතර ඔවුන් විසින් අනුගමනය කරන එම ක්‍රමවේදය අනෙකුත් ලංසුකරුවන් හා සාපේක්ෂව තාක්ෂණිකමය වශයෙන් උසස් තත්වයක් පිළිබිඹු නොවූවත් අදියර 06 කින් යුක්ත උක්ත ක්‍රමවේදය තුළින් ලොතරැයිපත්වල පිටු මාරු වීම වළක්වා ගත හැකි බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. | ලොතරැයිපත් අතරමැදින් අඩුවීමේ අවධානම ඉවත්වන පරිදි ලොතරැයිපත් මුද්‍රණය කිරීමට අවධානය යොමුකල යුතුය. |
| (ඊ) | මණ්ඩලය 2023 අප්‍රේල් 01 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදයේ ලොතරැයි මුද්‍රණය හා ගෙනවිත් භාරදීමට අදාළ දෝෂ හඳුනාගැනීම සඳහා කමිටු රැස්වීම් | වෙළඳපොළින් වාර්තා වනුයේ බරපතල ගණයේ මුද්‍රණ දෝෂ පමණක් වන අතර ආරක්ෂිත ආලේපය නොපෙනීම, තීන්ත පැල්ලම්, අකුරු බොඳවීම් වැනි | ලොතරැයිපත්වල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා අඛණ්ඩව තත්ත්ව පරීක්ෂාවක් සිදුකල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | පවත්වා තිබුණද, එම කාලපරිච්ඡේදයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා දෝෂ හඳුනාගැනීම සඳහා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණු අතර ලොතරැයිපත්වල විනිවිද පෙනෙන ආරක්ෂණය පියවි ඇසට නොපෙනීම, වර්ණ වෙනස්වීම්, තීන්ත පැල්ලම්, ඉලක්කම් ප්‍රමාණවල වෙනස්වීම් ඇතුළු දෝෂ ලොතරැයිපත්වල පැවැතුනත්, එම දෝෂ හඳුනාගෙන දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෝෂ වාර්තා වීම සිදු නොවේ. කෙසේ නමුත්, උක්ත තත්ත්වය සැලකිල්ලට ගනිමින් තත්ත්ව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය හා දඩ මුදල් අයකිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර මේ වනවිට ගනිමින් පවතී. | |
| ( උ) | මණ්ඩලය සඳහා පූර්ණ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) සංවර්ධනය කිරීම, සැපයීම, ක්‍රියාත්මක කිරීම, ස්ථාපනය, පුහුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය එක් වසරක නඩත්තු පිරිවැය පමණක් සැලැකිල්ලට ගෙන රු.96,788,864 ක් වූ ලංසු මිලට වර්ෂ 04 ක කාල සීමාවක් සඳහා ප්‍රදානය කර තිබුණි. කෙසේවුවද, මෙම ප්‍රසම්පාදනයේ වර්ෂ 04 හි රු.මිලියන 394 ක මුළු පිරිවැය සැලකිල්ලට ගත්තේ නම් රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 2.14.1 හා ඊට අදාළ 2017 මාර්තු 15 දිනැති අංක 33 දරන ව්‍යාතිරේඛයට අනුව, මෙම ප්‍රසම්පාදනය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු යටතේ සිදු කළ යුතු වුවත්, ඉන් බැහැර වී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී මට්ටම යටතේ සිදු කර තිබුණි. | සුදුසුකම්ලත් සැපයුම්කාර ආයතනය වෙතින් රු.96,788,864 ක් වූ ලංසු මිලට මෙම පද්ධතිය සංවර්ධනය කිරීම සැපයීම ක්‍රියාත්මක කිරීම ස්ථාපනය පුහුණු කිරීම සහ පළමු වසරේ නඩත්තුවද ඇතුළත්ව පූර්ණ සම්පත් ව්‍යවසාය පද්ධතියක් මිළදී ගැනීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අධිකාරී සීමාව යටතේ පවතින බැවින් එම පද්ධතිය මිළදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දීම සිදු කර ඇත. පිරිවැය සමාලෝචනයක් හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ස්වභාවයද පදනම් කර ගනිමින් තවදුරටත් ඉදිරි වසර 04 ක කාලයක් සඳහා මෙම පද්ධතිය නඩත්තු කිරීම සඳහා සුදුසු බවට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දී ඇත. | පද්ධතිය ස්ථාපනය කිරීමට යන මුළු පිරිවැය සැලැකිල්ලට ගෙන අදාළ අධිකාරි සීමාව යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම. |
| (ඌ) | මණ්ඩලය විසින් මහජන සම්පත ලොතරැයිය දිනුම් ඇදීම සඳහා උපයෝගී කරගන්නා යන්ත්‍රය විධිමත් පරිදි ක්‍රියාත්මක නොවීම, යන්ත්‍ර මගින් ලබාගන්නා ඉලක්කම්, අකුරු හා ලග්න නිවැරදි ලෙස එක් වරම යන්ත්‍ර මගින් ලබා නොදීම හා එම ඉලක්කම්, අකුරු හා ලග්න සහිත බෝල යන්ත්‍ර තුළ හිරවීම | ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා කුටීර 14 කින් සමන්විත දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිල දී ගැනීමට ආයතනය වෙත පිරිනැමීම සිදු කර ඇත. | නව යන්ත්‍රය ස්ථාපිත කිරීමේ කාර්යය කඩිනමින් අවසන් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන්, යන්ත්‍ර නැවත නැවත ක්‍රියාත්මක කිරීමට සිදුවූ අවස්ථා දිනුම් ඇදීමේ කාර්ය සඳහා සහභාගි වන විගණන කාර්ය මණ්ඩල විසින් නිරීක්ෂණය කර ඇති අතර, 2022 වර්ෂයේ විගණන වාර්තාව මගින්ද මේ සම්බන්ධයෙන් පෙන්වා දී තිබුණි. කෙසේවුවද, 2022 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට සහ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණු රු.මිලියන 150 ක් වූ Ball Drawing යන්ත්‍රය 2023 දෙසැම්බර් 31 දින දක්වා මිලදී ගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | | |
| (එ) | මණ්ඩලය විසින් දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරා ගැනීම සඳහා අවසන්වරට ප්‍රදානය කර තිබූ 2021/2022 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදනය කාණ්ඩ 05ක් යටතේ ප්‍රචාරණ නියෝජිත ආයතන 25 ක් තෝරාගෙන තිබූ අතර එම ආයතන 13 කින් කාර්ය සාධන බැඳුම්කර ලබාගෙන නොතිබූ අතර ආයතන 15 ක් සමග පමණක් මණ්ඩලය ලිඛිත ගිවිසුම්වලට එළඹී තිබුණි. | කාර්යසාධන ඇප බැඳුම්කර BTL කාණ්ඩයන් සඳහා තෝරා පත් කර ගන්නා ලද දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතනයන්ගෙන් ලබා ගැනීමක් සිදු නොකරන ලදී. ජාතික ලොතරැයි මණ්ඩලයේ BTL ක්‍රියාකාරකම් අවශ්‍යතාවයන්ට අනුව තෝරා පත් කර ලියාපදිංචි වූ BTL දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතනයන්ගෙන් මිල කැඳවීමක් සිදු කර අදාළ කොන්ත්‍රාත්තුවේ වටිනාකමට අනුව පමණක් ඇප බැඳුම්කරයක් ලබා ගැනීම සහ ගිවිසුම්ගත වීම සිදු කරනු ලබයි. | ප්‍රසම්පාදන කාර්යය සඳහා තෝරා ගන්නා ආයතන සමඟ මණ්ඩලය ලිඛිත ගිවිසුමකට ඇතුළත් විය යුතු වීම. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ලොතරැයි වර්ග කීපයක් සඳහා විශේෂ දිනුම්වාර 14 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, සැලසුම් කළ කාලය තුළ පවත්වා තිබුණේ මහජන සම්පත 5000 වන විශේෂ දිනුම්වාරය පමණි. එසේම ක්ෂණික තීරණ මත ලොතරැයිපත් හඳුන්වාදීමක් නොකොට ඒ සඳහා යම්කිසි සැලසුමකට අනුව නව ලොතරැයිපත් හඳුන්වාදීමට අභ්‍යන්තර මාර්ගෝපදේශ සකස් කරගත යුතු බවට 2020 දෙසැම්බර් 04 දිනැති | ජාතික ලොතරැයි මණ්ඩලයේ සෑම ලොතරැයි සන්නාමයක්ම ආවරණය වන පරිදි එක් එක් කාලීන අවශ්‍යතාවය, ඉලක්කගත පාරිභෝගික කණ්ඩායම්, තරඟකාරී විශේෂ වාරයන් පිළිබඳ අවධානය යොමු කර ප්‍රශස්ථ අලෙවියක් ලබා ගැනීම සඳහා විශේෂ දිනුම් වාරය පවත්වන දිනය, පවත්වන සන්නම් වර්ගය තීරණය කර ඊට පෙර වර්ෂයේ අයවැය හා ක්‍රියාකාරකම් සැලසුම් කරන අවස්ථාවේ තීරණය කරන ලද විශේෂ දිනුම් වාර පවත්වන දිනයන් සංශෝධනයට හා | විශේෂ දිනුම්වාර පැවැත්වීම සම්බන්ධව අභ්‍යන්තර මාර්ගෝපදේශ සකස් කරගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. | විස්තරාත්මක සැලැස්මට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන අදාල විශේෂ වාර ක්‍රියාත්මක කරයි. | |
| (ආ) | මණ්ඩලය විසින් රු.මිලියන 4.8 ක් වටිනාකමැති කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මිලදී ගෙන ස්ථාපනය කිරීමට ලංසු කැඳවා සැපයුම්කරුවකු වෙත 2024 පෙබරවාරි 07 දින ලංසු ප්‍රදානය කර තිබුණි. 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණු මෙවැනි අධික පිරිවැයක් සහිත මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය සහ ඒ සඳහා වැයවන පිරිවැය, ප්‍රතිලාභ විගණනය වෙත පැහැදිලි නොවූ අතර, එය රු.මිලියන 96.79 ක පිරිවැයක් දරමින් සිදුකරන ERP පද්ධතිය මගින් ඉටු කර ගැනීම කෙරෙහි මණ්ඩලය අවධානය යොමු කර නොතිබුණි. | මෙම මෘදුකාංගය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදී ඇති පරිගණක මත පමණක් ක්‍රියාත්මකවීම සිදුවන අතර, ERP වැනි මධ්‍යගත පරිගණක පද්ධතියක් මගින් පාලනය වන තොරතුරු පද්ධතියකට අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු සෘජුව සම්බන්ධවීම එම තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් ඇතිවීම සිදුවිය හැකි බැවින් බොහෝ රාජ්‍ය හා පෞද්ගලික ව්‍යාපාරයන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට යොදාගැනෙන මෙම මෘදුකාංගය ඒ සඳහා විශේෂඥ ආයතනයක් මගින් ආරක්ෂණ ක්‍රමවේදයන් යටතේ හා නියමිත සම්මත තත්ත්වයන් යටතේ අදාල කාර්යයට සුවිශේෂිතව නිර්මාණය කර ඇත. | ERP පද්ධතියට ප්‍රවේශවීම් සීමාකර රහස්‍යභාවය ආරක්ෂාවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සහ වර්ෂය අවසානයට එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් 98 ක් දක්වා තිබුණි. ඒ අතරින් කාර්යයන් 28 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර නොතිබුණු අතර කාර්යයන් 18 ක් නිම නොවී පැවතුණි. තවද, නිම නොවූ කාර්යයන්වල නිමකළ ප්‍රමාණයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ වාර්තාවේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ ආරම්භ කර සිදු කර ගෙන යන නමුත් එහි නිමවූ ප්‍රමාණයයන් සමහර ක්‍රියාකාරකම්වල ප්‍රමාණාත්මකව දැක්විය නොහැක. එම ක්‍රියාකාරකම් තවදුරටත් සිදුවන අතර 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අන්තර් ගත කර ඇති අතර ඒ පිළිබඳ ප්‍රගතිය 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමඟ පසුව ඉදිරිපත් කළ හැක. | ක්‍රියාකාරී සැලැස්මේ ඇති කාර්යයන් වල ප්‍රගතිය කාලීනව පරීක්ෂා කල යුතුය. |